සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2019.05.10 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2019/08**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/ බැංකු සමිති කළමනාකරුවන් වෙත.**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින්ට ගෘහස්ථ එල්.පී.ගෑස් (L.P.Gas) පහසුකම ලිට්රෝ ගෑස් ලංකා සමාගම වෙතින් ලබා ගැනීමට අවස්ථාව සැලසීම සහ බැංකු ණය පහසුකම ලබාදීම.</u>**

**01.** **හැඳින්වීම.**

සමෘද්ධි ප්‍රජාමූල ක්ෂුද්‍ර මූල්‍යකරණ බැංකු ජාලය හා එකතු වී ඇති සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ට එල්.පී.ගෑස් පහසුකම ලබා ගැනීමට අවශ්‍ය ගෑස් සිලින්ඩරයක් ඇතුළු උපාංග සහන මිලකට ලබාදීමට ලිට්රෝ ගෑස් ලංකා සමාගම යෝජනාවක් ඉදිරිපත් කර ඇත.එම යෝජනාව සඳහා බැංකු කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව මෙම වැඩසටහන දියත් කිරීම තුලින් පහත අරමුණු ලගා කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

1. අඩු ආදායම්ලාභීන් වන බැංකු සාමාජිකයින්ගේ, දෛනික ජීවන කටයුතු කර ගැනීම පහසු කිරීම.
2. ආපනශාලා, රසකැවිලි නිෂ්පාදනය ඇතුළු ආදායම් උත්පාදන කටයුතු වල නිරත ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කටයුතු පහසුකර ආදායම් ඉහළ නැංවීම
3. බැංකු ණය ප්‍රමාණය ඉහළ නැංවීම තුලින් බැංකු මූල්‍ය තිරසාරභාවය ඇති කිරීම.
4. පාරිසරික සුරක්ෂිතතාවය ඇති කිරීමට උදව් කිරීම.

ගෘහස්ථ එල්.පී ගෑස් පහසුකම අවශ්‍ය වන්නා වූ බැංකු සාමාජිකයින්ට ලබා ගැනීමට උදව් කිරීම හා ඒ සඳහා මූල්‍ය අවශ්‍යතා අවශ්‍යවන්නා වූ පිරිස් සඳහා සේවා සැපයීමට අවශ්‍ය මග පෙන්වීමට සිදු කිරීමට මෙමගින් සිදුකෙරේ.

**02.** **ලබාදෙන උපාංග පිළිබඳ විස්තරය**

එල්.පී.ගෑස් සිලින්ඩරය ඇතුළු ලබාදෙන උපාංග හා මිල ගණන්වල විස්තරය ඇමුණුම් 01 මගින් දක්වා ඇත.

**03.** **උපරිම ණය මුදල, ණය පිළිබඳ තොරතුරු**

03.1. උපරිම රු.10,000 ණය මුදලක් ලබාදිය හැකි අතර, ණය ඉල්ලුම්කරුගේ ඉල්ලීම හා අවශ්‍යතාවය පරිදි එක් ණය මුදලක් පමණක් ලබාදිය යුතුය.

03.2. මෙම වැඩසටහන සඳහා, නව යෝජනා ක්‍රමයක් දියත් නොකරන අතර දැනට ක්‍රියාත්මක පහත ණය වැඩසටහන් යටතේ ණය ලබාදිය හැක.

1. පාරිභෝගික ණය - දැනටමත් සමූහ ණය සංරක්ෂණ වැඩසටහනට දායක වී ඇති සුදුසුකම් සහිත සාමාජිකයින්ට
2. හදිසි ව්‍යාපාරික ණය
3. ජීවනෝපාය සංවර්ධන ණය

} ආදායම් උත්පාදන කාර්යයක නිරත වන අය සඳහා මෙම පහසුකම ලබාදීම.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288772** |

03.3. ණය මුදල් ඉල්ලුම් කිරීමේ සිට අනුමත කිරීම ඇතුළු සියළුම උපදෙස් දැනට ණය සම්බන්ධ නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් පරිදි සිදුවිය යුතුය.මෙම වැඩසටහන යටතේ ණය පහසුකම් ලබා දීමේදී මෙහෙයුම් උපදෙස් කඩ නොකළ යුතුයි.

03.4. බැංකුව හරහා පමණක්, සාමාජිකයන්ට ණය පහසුකම් නොමැතිව එකවර මුදල් ගෙවා මෙම පහසුකම ලබා ගැනීමට ඉඩදෙනු ලැබේ.

## 04. ගෑස් පහසුකම ඉල්ලුම් කිරීම හා උපකරණ කට්ටලය ලබාදීම.

04.1. සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ නිලධාරීන් විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හරහා අඩු ආදායම්ලාභීන් දැනුවත් කිරීම සිදු කරයි. ඒ සඳහා රැස්වීම් සංවිධානය කිරීම සම්බන්ධීකරණය වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සිදු කල හැක.

04.2. ප්‍රතිලාභීන් දැනුවත් කිරීමෙන් අනතුරුව, ප්‍රතිලාභීන් විසින් ස්ව කැමැත්ත මත අදාල ගෘහස්ථ ගෑස් පහසුකම ඇතුළු උපාංග කට්ටලය ලබා ගැනීමට තීරණය කල පසු, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවෙන් ණය පහසුකම ඉල්ලුම් කිරීම හා කැමැත්ත ලිඛිතව ලබා දීම සිදුකල යුතුය.

04.3. සාමාජිකයන්, ප්‍රජාමූල බැංකු හරහා ගෑස් කට්ටලය ලබා ගැනීමට කැමැත්ත පල කළ විට, **බැංකු ණය පහසුකම** ලබාදිය හැකි ඉල්ලුම්කරුවන්ගේ පමණක් පහත තොරතුරු රැස්කර, සකස් කර සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගම හෝ බලයලත් නියෝජිතයින් වෙත විද්‍යුත් හෝ තැපැල් මාර්ගයෙන් යොමු කළ යුතුය.

01. ඉල්ලුම්කරුගේ නම
02. සමාජික අංකය
03. ඉල්ලුම්කරුගේ ඉල්ලුම් කරන ගෑස් කට්ටලය (පැකේජය)
04. ලිපිනය
05. දුරකථන අංකය
06. ප්‍රජාමූල සංවිධානයේ නම

තැපැල් ලිපිනය :- කුමාර ජයවර්ධන
ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය අලෙවි කළමණාකරු
ලිට්රෝ ගෑස් ලංකා සමාගම
යුනියන් පෙදෙස
කොළඹ - 02

04.4. වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින්, සාමාජිකයින්ට ණය ලබා ගැනීමට සහාය ලබාදිය යුතු අතර, සම්පූර්ණ කරන ලද ණය ඉල්ලුම් පත්‍ර බැංකුව වෙත ලබාදීම සිදුකල යුතුය.ප්‍රජාමූල බැංකු විසින් නිසි පරීක්ෂාවෙන් අනතුරුව, නිර්දේශ සහිත පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.

04.5. ණය මුදල අනුමත කිරීමෙන් අනතුරුව, සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගම වෙතින් මිලදීගත් ගෑස් උපාංග කට්ටලය වෙනුවෙන් මුදල් ප්‍රේෂණ කිරීම සඳහා සමාජික ගිණුමෙන් අඩුකර, අදාල සමාගමට ලබාදීමට සාමාජිකයාගේ කැමැත්ත ලිඛිතව ලබාගත යුතුය.

04.6. ණය මුදල අනුමත වූ පසු කළමණාකරු විසින්, ණය ඉල්ලුම්කරු වෙත ණය මුදල අනුමත කල බවට ලිඛිතව දැනුම් දිය යුතුය.

04.7. ණය මුදල අනුමත වූ පසුව පමණක්, සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් අදාල ගෑස් සිලින්ඩරය ඇතුළු උපාංග කට්ටලය ඉල්ලුම්කරුට (සාමාජිකයා) භාරදීමට කටයුතු කරනු ලබයි.

04.8. ඉන් අනතුරුව, ඉල්ලුම්කරු ( සාමාජිකයා) අදාල ගෑස් සිලින්ඩරය හා ඇතුළු උපාංග කට්ටලය භාරගත් බවට සමාජිකයාගේ අත්සන සහිත භාණ්ඩ ලැබීම් පත්‍රිකාවේ පිටපතක් බැංකු කළමණාකරු වෙත භාරදිය යුතුය. (සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ අලෙවි නියෝජිතයන්)

04.9. සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගම හෝ බලයලත් අලෙවි නියෝජිතයා විසින් අදාල ගෑස් උපාංග කට්ටලය භාර දී ඉන් අනතුරුව, ඉන්වොයිසියක් බැංකුව වෙත ලබාදෙනු ලැබේ. එම ඉන්වොයිසිය හා භාණ්ඩ ලැබීම් විස්තරය තොරතුරු අනුව, අදාල මුදල චෙක්පතකින් සමාගමේ බලයලත් නියෝජිතයින් වෙත පහත පරිදි ගිණුම් ගතකර ලබා දීමට පියවර ගත යුතුය.

**05. සාමාජිකයා වෙනුවෙන් සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ බලයලත් අලෙවි නියෝජිතයා වෙත මුදල් ලබාදීම හා බැංකුවට හිමි කොමිස් මුදල රැස් කර ගැනීම.**

05.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් පහත පරිදි, සමාගම වෙත මුදල් යැවීම හා කොමිස් මුදල ගිණුම්ගත කල යුතුය. (සාමාජිකයාගේ ඉල්ලීම මත)

හර - සාමාජික තැන්පත් ගිණුම (සාමාජිකයාගෙන් අයකරන මුදල)
බැර - ලද ආදායම් මිශ්‍ර ගිණුම (බැංකුවට හිමි කොමිස් මුදල)
බැර - ජංගම ගිණුම (සාමාජිකයා ගෙවිය යුතු මුදලින්, කොමිස් මුදල අඩුකල පසු ඉතිරි මුදල)

05.2. කොමිස් මුදල ගණනය කිරීම ඒ ඒ පැකේජය අනුව, ගණනය කල යුතුය. ඉන් අනතුරුව සී/ස ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ බලයලත් අලෙවි නියෝජිතයා වෙත යැවිය යුතු මුළු මුදලින්, බැංකුවට හිමි කොමිස් මුදල අඩුකර ඉතිරි මුදලට සමාන මුදල් සඳහා චෙක්පත් ලිවිය යුතුය.(ඉන්වොයිස් වල සඳහන් වටිනාකම සඳහා)

05.3. චෙක්පත රේඛනය කර අදාල බලය ලත් නියෝජිතයා නමට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. මෙම මුදල් ප්‍රේෂණය, ඉන්වොයිසිය හා භාණ්ඩ ලැබීම් පත්‍රිකාව බැංකුවට ලැබී දින 45 නොඉක්මන කාලයක් තුළ සිදුකළ යුතුය.

05.4. මෙම වැඩසටහන යටතේ ඇමුණුම් - 02 පරිදි, තොරතුරු ඇතුලත් රෙජිස්තරයක් බැංකුව නඩත්තු කළ යුතුය.

**06. පොදු කරුණු**

06.1. මෙම වැඩසටහන2019.03.11 සිට 2020.09.10 දක්වා පමණක් ක්‍රියාත්මක වේ. ඉන් අනතුරුව මෙම වැඩසටහන අහෝසි වන අතර,තවද මෙම කාලය අවසන් වීමටපෙර,වැඩසටහන අත්හිටුවීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තීරණය කල හොත්,ඒ බව දැනුම් දීම සිදු කරනු ලබයි. එදින සිට වැඩසටහන අවසන් කල යුතුය.

06.2. සමෘද්ධි බැංකු සාමාජිකයන් සඳහා ණය ආපසු ගෙවීමේදී මාසික සම වාරික වලින් ගෙවීම ඉඩකඩ ලබාදිය හැක.

06.3. මෙම වැඩසටහන පිළිබඳ බැංකු පාලක මණ්ඩල දැනුවත් කර ඔවුන්ගේ එකඟතාවය මත ක්‍රියාකිරීම වඩාත් සුදුසු වේ.

06.4. මෙම වැඩසටහන යටතේ අදාල ගෑස් සිලින්ඩර ඇතුළු උපාංග කට්ටල භාරගෙන බැංකුව/ ක්ෂේත්‍ර වසම් කාර්යාල වල ගබඩාකර, බෙදා හැරීම කිසිදු අයුරකින් සිදු නොකල යුතුය. මේ පිළිබඳ බැංකු කළමණාකරු ඇතුළු කාර්ය මණ්ඩලය දැඩි අවධානයක් යොමු කල යුතුය.

06.5. මෙම වැඩසටහන යටතේ, ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම පිළිබඳ, වසම භාර නිලධාරීන් හා කළමණාකරු විසින් සාමාජිකයින්ට මහපෙන්වීම කල යුතුය.

06.6. අදාල සාමාජිකයා විසින්, තම ස්ව කැමැත්ත මත අදාල පහසුකම සඳහා ඉල්ලුම් කල යුතු අතර, ඒ සඳහා තොරතුරු සැපයීම පමණක් අප විසින් සිදු කල යුතුය.

06.7. මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගැනීම සඳහා සී/ස ලිට්රෝ ගෑස් සමාගමේ පහත නිලධාරීන් අමතා ලබා ගත හැක.

- කුමාර ජයවර්ධන (ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය අලෙවි කළමණාකරු) -0777775658
- තරිඳු දේශාන් (ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක) - 0778917526

**එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර**
**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත් :- 01.ලේකම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.පි.
02.සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.
05. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි.
06. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, - කා.දැ.පි.
07. සියලුම විධායක කමිටු සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය. - කා.දැ.පි.
08. සියලුම පාලක මණ්ඩල සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව. -කා.දැ.පි.

ඇමුණුම **- 01**

**ගෘහහස්ථ එල් පී ගෑස් සහිත සිලින්ඩරය ඇතුළු උපාංග හා මිල ගණන් පිළිබඳ විස්තරය.**

| පැකේජය | විස්තරය | වෙළෙඳ මිල (රු.) | සමෘද්ධි ලාභීන් සඳහා විශේෂ මිල (රු.) | සමෘද්ධි බැංකුවේ ලාභ ආන්තිකය (රු.) |
|---|---|---|---|---|
| 01 | 12.5Kg සිලින්ඩරය | 4400.00 | 4265.00 | 550.00 |
| | ගෑස් සඳහා (කොළඹ මිල) | 1733.00 | 1700.00 | |
| | රෙගුලේටර් කට්ටලය | 1405.00 | 1245.00 | |
| | ලිප් දෙකේ ගෑස් උදුන (සාමාන්‍ය ලිප) | 3754.00 | 2785.00 | |
| | **මුළු එකතුව** | **11292.00** | **9995.00** | |
| 02 | 5 Kgසිලින්ඩරය | 3300.00 | 3300.00 | 467.00 |
| | ගෑස් සඳහා (කොළඹ මිල) | 693.00 | 683.00 | |
| | රෙගුලේටර් කට්ටලය | 1405.00 | 1245.00 | |
| | ලිප් දෙකේ ගෑස් උදුන (සාමාන්‍ය ලිප) | 3754.00 | 2785.00 | |
| | **මුළු එකතුව** | **9152.00** | **8013.00** | |
| 03 | 12.5 Kgසිලින්ඩරය | 4400.00 | 4400.00 | 353.00 |
| | ගෑස් සඳහා(කොළඹ මිල) | 1733.00 | 1700.00 | |
| | රෙගුලේටර් කට්ටලය | 1405.00 | 1245.00 | |
| | **මුළු එකතුව** | **7538.00** | **7345.0**0 | |
| 04 | 5 Kgසිලින්ඩරය | 3300.00 | 3300.00 | 253.00 |
| | ගෑස් සඳහා | 693.00 | 683.00 | |
| | රෙගුලේටර් කට්ටලය | 1405.00 | 1245.00 | |
| | **මුළු එකතුව** | **5398.00** | **5228.00** | |

ඇමුණුම **02**

<u>**සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින් සඳහා සීමාසහිත ලිට්රෝ ලංකා සමාගම සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන එල්.පී. ගෑස් පහසුකම ලබාදීමේ වැඩසටහන**</u>

| දිනය | ඉන්වොයිස් අංකය | ඇණවුම් අංකය | ගෑස් උදුන් උපකරණ ක්‍රි.ග්‍රෑ.12.5 ගෑස් සිලින්ඩර හා උපාංග කට්ටල | | ගෑස් උදුන් උපකරණ ක්‍රි.ග්‍රෑ.5 ගෑස් සිලින්ඩර හා උපාංග කට්ටල | | එකතුව | | කොමිස් මුදල (රු.) | | සීමාසහිත ලිට්රෝ ලංකා සමාගමට යවන ලද මුදල (රු.) | චෙක් පත් අංකය | චෙක් පත් ලබා දුන් දිනය | නිලදරු අත්සන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගණන | මුදල (රු.) | ගණන | මුදල (රු.) | ගණන | මුදල (රු.) | ක්‍රි.ග්‍රෑ. 12.5 | ක්‍රි.ග්‍රෑ. 5 | | | | ලිපිකරු | කළමණාකරු |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |